www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ජර්මානු ආන්ඩුව එක්සත් ජනපදයේ ඇෆ්ඝනිස්ථාන මූලෝපාය පසුපස පෙල ගැසෙයි

**German government falls in behind US strategy for Afghanistan**

**2010 ජනවාරි 28**

ජනාධිපති බැරක් ඔබාමාගේ නියෝගය යටතේ ඇෆ්ඝනිස්ථානයෙහි සිදු කරන්නට යන එක්සත් ජනපද කඩා වැදීමට සහාය දීම සඳහා අතිරේක ජර්මානු භට කන්ඩායමක් යවන බවට ජර්මානු පාර්ලිමේන්තුව (බුන්ඩෙස්ටාගය) හමුවේ බදාදා කල කතාවක දී චාන්සලර් ඇන්ජෙලා මර්කල් (ක්‍රිස්තියානි ප්‍රජාතන්ත්‍රවාදී සංගමය, සීඩීයූ) පොරොන්දු වූවා ය. අදට නියමිත ලන්ඩන් ඇෆ්ඝනිස්ථාන සමුලුව සඳහා රැස් වන විදේශ ඇමතිවරුන් 60 දෙනෙකු හමුවේ, ජර්මානු විදේශ ඇමති ගුයිඩෝ වෙස්ටර්වෙල්, එක්සත් ජනපද-නේටෝ යුද්ධයට ජර්මනිය ලබා දෙන නව දායකත්වය ප්‍රකාශයට පත් කරන්නට යයි.

යුද භටයන් 4,500කින් සමන්විත සිය වත්මන් බලඇනිය තවත් භටයන් 500කින් වැඩි කිරීමට ද "නම්‍යශීලී විශේෂ බලකායක" ස්වරූපයෙන් තවත් අතිරේක සොල්දාදුවන් 350ක් ඊට එක් කිරීමට ද ජර්මානු ආන්ඩුව 25 දින හැන්දෑවේ එකඟ විය.

එමෙන් ම ජර්මනිය, යූරෝ මිලියන 350 ක් වන ජාත්‍යන්තර අරමුදලේ සිය දායකත්වය යූරෝ මිලියන 50 (එ.ජ. ඩොලර් මිලියන 70) න් ඉහල නැංවීමට එකඟත්වය පල කලේය. මෙම අරමුදලේ අරමුන වන්නේ වාඩි ලා ගත් හමුදා වෙත තලේබාන් සාමාජිකයන් නම්මා ගැනීම සඳහා අල්ලස් දීමය. බර්ලිනය, ඊනියා "සිවිල් ජනයා නඟාසිටුවීමේ" ව්‍යාපෘති සඳහා තමන්ගේ දායකත්වය යූරෝ මිලියන 430ක් දක්වා දෙගුනයකට ආසන්න ප්‍රමානයකින් වැඩි කරන්නට ද යයි.

භටයන් සහ මුදල් වැඩි කිරීම සිදු වන්නේ ඇෆ්ඝනිස්ථානයෙහි සිටින ජාත්‍යන්තර ආරක්ෂක සහායක බලකායේ අන දෙන නිලධාරියා වන එක්සත් ජනපද ජනරාල් ස්ටැන්ලි මැක්ක්‍රිස්ටල් කල ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙනි. මේ මාසයේ මුල දී බිල්ඩ් නමැති ජර්මානු පුවත්පතට සම්මුඛ සාකච්ඡාවක් ලබා දෙමින්, සිය කැප වීම වැඩි කරන ලෙස ඔහු ජර්මනියෙන් ඉල්ලා සිටියේ ය.

ජර්මානු ජනගහනයෙන් හතරෙන් තුනක් යුද්ධයට විරුද්ධත්වය පල කර තිබිය දීත් මහජන මතයට පයින් ගසමින් ආන්ඩුව, යුද්ධයෙන් වැනසී ගිය ඇෆ්ඝනිස්ථානයෙහි සිදු වන ජන ඝාතන ද විනාශය ද නියත ලෙස ම ඉහල නැංවෙන මෙම පියවරයන්ට අවසර දුන්නේ ය. අතිරේක හමුදා භටයන් සහ මුදල් සැපයීමට අමතරව, "හවුල් වීමේ" එක්සත් ජනපද මිලිටරි මූලෝපාය - එනම්, සටන් වදින අවස්ථාවල දී ජර්මානු භටයන් සහ ඇෆ්ඝනිස්ථාන භටයන් යුගල වශයෙන් යෙදවීම - පිලිගැනීමට ද ජර්මානු ආන්ඩුව එකඟ වී ඇත.

සෘජු සටන්වලට මැදිහත් වීමේදී ජර්මානු හමුදාව (බුන්ඩෙස්වෙහ්ර්) පෙන්වන පසුබෑම විවේචනයට ලක් කරමින් මැක්ක්‍රිස්ටල් කල ඉල්ලීමට ද මෙය ප්‍රතිචාරයකි. ජර්මානු හමුදා අතින් ඇෆ්ඝන් කැරලිකරුවන්ට සහ සිවිල් වැසියන්ට සිදු වන හානි බෙහෙවින් ඉහල මට්ටමකට නැගීමට ද ජර්මානු සොල්දාදුවන්ගේ මරන සංඛ්‍යාව සැලකිය යුතු ලෙස වැඩි වීමට ද නව ජර්මානු මිලිටරි මූලෝපාය හේතු වනු ඇත.

අඟහරුවාදා පැවති පුවත්පත් සාකච්ඡාවක දී, "ජර්මානු හමුදාවේ ආක්‍රමනික හැකියාවන් ප්‍රතිසංවිධානය කෙරෙන බෙහෙවින් ම ආරක්ෂාකාරී ප්‍රවිෂ්ටයක්" හැටියට වංචනික ලෙස "නව ප්‍රවිෂ්ටය" හුවා දක්වමින් සිය ඇෆ්ඝනිස්ථාන පිලිවෙතේ සැබෑ හරය වසං කිරීමට මර්කල් උත්සාහ කලා ය.

ඇෆ්ඝන් සොල්දාදුවන් සහ පොලීසිය පුහුනු කිරීම සම්බන්ධයෙන් ජර්මානු භටයන් ඉටු කල කාර්ය භාරය බුන්ඩෙස්ටාගය හමුවේ කල කතාවේ දී මර්කල් අවධාරනය කලා ය. ඒ අතර මෙම සතියේ මුල දී, ආන්ඩුවේ සංවර්ධන කටයුතු පිලිබඳ ඇමති ඩර්ක්

නීබෙල් (එෆ්ඩීපී), "සිවිල් සමාජය යලි ගොඩ නැගීමේ ව්‍යාපෘතිවල" දී ජර්මනිය ඉටු කල කාර්ය භාරය අවධාරනය කලේ ය.

මෙකී සියලු දෑ ජර්මානු මහජනයාගේ ඇස්වලට වැලි ගැසීම ඉලක්ක කර ගෙන ගෙතූ බේගල් ය. ඇෆ්ඝනිස්ථානයෙහි සිදු වන යුද්ධයේ සැබෑ ස්වභාවයත් ජර්මනියේ නව ස්ථාවරය නිසා ඇති වන ප්‍රතිවිපාකත් සම්බන්ධයෙන් දෙපිටකාට්ටු කතා කියන්නට මර්කල්ට හැකි වී තිබෙන්නේ, දේශපාලන විරුද්ධ පාර්ශ්වය නව ක්‍රියා මාර්ගයට සහාය දෙන බව ප්‍රකට කර ඇති නිසා ම පමනකි. ජර්මානු පාර්ලිමේන්තුවේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී කන්ඩායමේ නායකයා ද ඇෆ්ඝනිස්ථානයෙහි අනුගමනය කරන මිලිටරි පිලිවෙත සම්බන්ධයෙන් වගකිව යුතු හිටපු විදේශ ඇමතිවරයා ද වන ෆ්‍රෑන්ක් වෝල්ටර් ස්ටයින්මියෙර්, "ආන්ඩුව අප ගත් මග ඔස්සේ ගමන් කරමින් සිටිනු දැකීම බෙහෙවින් සතුටට කරුනක්" යැයි ප්‍රකාශ කරමින් ආන්ඩුවේ නව ප්‍රවිෂ්ටය සාදරයෙන් පිලිගත්තේ ය.

තමන් දෙන ඡන්දයේ කිසිදු වැදගත් කමක් නැති තත්වය හමුවේ, "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" කර ගෙන යාමට සුදුසු තැන ඇෆ්ඝනිස්ථානය නො වේ යැයි තර්ක කරමින්, ජර්මානු භටයන් ඇෆ්ඝනිස්ථානයෙහි රැඳ වීමට එරෙහිව වාම පක්ෂය අතීතයේ දී පාර්ලිමේන්තුව තුල ඡන්දය දී ඇත. එමෙන් ම, සුදුසු "පිටවීමේ මූලෝපාය" කුමක් ද යන්න සම්බන්ධයෙන් තමන් ආන්ඩුව සමග පවත්වා ගෙන යන සාකච්ඡාවලට පක්ෂපාතිත්වය පල කිරීමක් වශයෙන්, ජර්මානු හමුදා ඉවත් කර ගත යුතු බවට තමන් කරන ඉල්ලීම ඉවත ලෑමට සූදානම් බව හිටපු සභාපති ඔස්කාර් ලැෆොන්ටේන් ඇතුලු ප්‍රමුඛ පක්ෂ නායකයෝ ඇඟවා සිටියහ.

ඇෆ්ඝනිස්ථානය තුල දී ක්‍රියා කල යුතු ආකාරය පිලිබඳව ඒකමතික ආස්ථානයකට පැමිනීම සඳහා, පසු ගිය සැප්තැම්බරයෙහි බලයට පත් වූ තැන් පටන් ම සීඩීයූ-එෆ්ඩීපී ආන්ඩුව බොහෝ සේ වෙහෙසී ඇත. ජර්මානු කර්නල්වරයෙකු දුන් නියෝග අනුව සැප්තැම්බර් 4 වන දා ඇෆ්ඝන්වරුන් 170 දෙනෙකුට ආසන්න සංඛ්‍යාවකගේ ජීවිත වනසමින් කුන්ඩූස්හි දී යුද නැව් දෙකකින් එල්ල වුනු බෝම්බ ප්‍රහාර සේවය කලේ ඇෆ්ඝනිස්ථානයේ දී බුන්ඩෙස්වෙහ්ර් හමුදාව ඉටු කරන කාර්ය භාරය පිලිබඳව ජර්මනිය තුල සිදු වන මහජන විවාදය අවුලුවා ලීමට පමනකි. කුන්ඩූස් ජන සංහාරයෙන් නියෝජනය වන්නේ, දෙවන ලෝක යුද්ධයේ දී හිට්ලර්ගේ වෙහ්ර්මක්ට් හමුදාව සිදු කල කෲරකම්වලින් මෙපිට දී ජර්මානු හමුදාව අතින් සිදු වූ විශාලතම සිවිල් ජන ජීවිත හානිය යි.

ජර්මානු ප්‍රොතෙස්තන්ත පල්ලියේ අගරදගුරු මාර්ගොට් කාස්මාන්, යුද්ධය යුක්ති සහගත කල නොහැකි යැයි ද බුන්ඩෙස්වෙහ්ර් හමුදාව ආපසු කැඳවිය යුතු යැයි ද ප්‍රකාශ කරමින් මෙම මස මුල දී යුද්ධයට එරෙහිව ප්‍රසිද්ධියේ කතා කල විට ඇය, ආන්ඩු බලධාරීන්ගේ තියුනු විවේචනයට ලක් වූවාය.

පෙරට යා යුතු ආකාරය සම්බන්ධයෙන් ආන්ඩුවේ සාමාජිකයන් අතර ද වෙනස් මත පැතිර ගියේ ය. ජනවාරි 28 වන දා ලන්ඩනයෙහි පැවැත්වෙන සමුලුව අතිරේක හමුදා යෙදීම පිලිබඳ ගැටලුව වටා කේන්ද්‍රගත වුව හොත් තමන් එම සමුලුව වර්ජනය කරන්නට ඉඩ තිබෙන්නේ යැයි පසු ගිය වසර අග දී විදේශ ඇමති වෙස්ටර්වෙල් ප්‍රකාශ කර තිබුනි.

"නිදහස් වෙලඳ පොල පිලිවෙතට" කැපවූ එෆ්ඩීපීයේ සභාපති වන වෙස්ටර්වෙල් වෙතින් නියෝජනය වන්නේ, නැගෙනහිර යුරෝපය ඇතුලු අවශේෂ යුරෝපා රටවල් ද මධ්‍යම ආසියාව ද සමග සමීප සබඳතා පවත්වා ගැනීම සමග නේටෝව කෙරෙහි ජර්මනියට පවතින බැඳීම තුලනය වන බහුපාර්ශ්වීය පිලිවෙතකට පක්ෂව කතා කල හිටපු දිගු කාලීන එෆ්ඩීපී විදේශ ඇමතියෙකු වන හැන්ස්-ඩියෙට්රිච් ගෙන්ස්චර් වෙතින් සන්නිදර්ශනය වන ජර්මානු විදේශ පිලිවෙතේ පැතිකඩ යි.

එෆ්ඩීපීයෙන් එල්ල වන පීඩනය තිබිය දී ම, ජර්මානු හමුදා ආපසු කැඳවීම සම්බන්ධයෙන් නිශ්චිත දිනයක් ලබා දීමට මර්කල් ප්‍රතිරෝධය දක්වයි. මෙහි ලා ඇය අනුගමනය කරන පිලිවෙත, ලන්ඩනයේ ඇෆ්ඝනිස්ථානය පිලිබඳ සමුලුවේ දී ඉදිරිපත් කිරීම සඳහා පිලියෙල කර ගෙන ඇති ආස්ථානය සමග පැහැදිලිව ම සම්බන්ධ ය.

සමුලුව සඳහා සැලසුම් කරන ලදුව පුවත්පත්වලට නිකුත් කල කෙටුම්පත් ප්‍රකාශය, හමුදා ආපසු කැඳවීම සඳහා වන කාල සටහනක් ගැන කිසිදු සඳහනක් නොකලේ ය. ඒ වෙනුවට, තවත් අඩ දශකයක් ගත වන තුරු වුවත්, තම ආරක්ෂාව පිලිබඳ සම්පූර්න වගකීම තමන් වෙත පවරා ගැනීමට ඇෆ්ඝනිස්ථානයට නොහැකි වනු ඇති බව කියා සිටි එය, නේටෝවේ මිත්‍ර පාක්ෂිකයන්ට ඇෆ්ඝනිස්ථානය කෙරෙහි පවතින "දිගු කාලීන බැඳීම" අවධාරනය කරයි.

ආරක්ෂක ඇමති කාල්-තියොඩෝර් සු ගුටෙන්බර්ග් (ක්‍රිස්තියානි සාමාජීය සංගමය, සීඑස්යූ) මෙම සතියෙහි පැහැදිලි කල පරිදි, අතිරේක හමුදා යැවීමට පලවූ ජර්මනියේ එකඟත්වය, එක්සත් ජනපදයේ ඉල්ලීම් මුලුමනින් ම සපුරාලනු නැත. එසේම ජර්මානු මිලිටරි ආඥාපතිගේ බලාපොරොත්තු ද මුලුමනින්ම සැපිරෙන්නේ නැත. ජර්මානු

චාන්සලර්වරිය ද ආරක්ෂක ඇමතිවරයා ද විදේශ ඇමතිවරයා ද යන මේ සියලු දෙනා සිය පොදු "නව ප්‍රවිෂ්ටය" වග වර්නනා කිරීම සඳහා වෙන වෙන ම පුවත්පත් සාකච්ඡා පැවැත්වීමෙන් ඇඟවෙන්නේ ඇෆ්සනිස්ථාන පිලිවෙත සම්බන්ධයෙන් ආන්ඩුව තුල තව මත් වෙනස් මත පවතින බව යි.

එහෙත්, සිදු වෙමින් පවතින අඬදබර මධ්‍යයේ ම, ජර්මානු ආන්ඩුව තුල සිටින සන්ධාන හවුල්කරුවෝ සැලකිය යුතු ලෙස යුද්ධය තීව්‍ර කෙරෙන දල එකඟතාවක් ඇතිකරගෙන තිබේ.

පෙනෙන හැටියට නම්, බ්‍රිතාන්‍ය අගමැති ගෝර්ඩන් බ්‍රවුන් ද ප්‍රන්ස ජනාධිපති නිකොලස් සාර්කොසි ද සමග එක්ව මර්කල් පසු ගිය සැප්තැම්බරයෙහි ඇෆ්සනිස්ථාන සමුලුවක් සඳහා වූ කැඳවුම නිකුත් කලේ යුද්ධය සඳහා නව මූලෝපායක් වර්ධනය කර ගනු පිනිස ය.

"නව" මූලෝපාය කුමක් දැයි දැන් පැහැදිලි ය - එනම්, දැනට මත් සියදහස් සංඛ්‍යාත ඇෆ්සනිස්ථානුවන්ට මරනය ද දුක්ඛිත භාවය ද අත් කර දී ඇති, දැනට මත් පලමු වන ලෝක යුද්ධය මෙන් දෙගුනයක් තරමේ කාලයක් තිස්සේ පැවතී ගෙන ගොස් ඇති සාපරාධී මිලිටරි වාඩි ලා ගැනීම ම වඩා දැවැන්තව කර ගෙන යාමකි. ජර්මන් හමුදාවේ සංඛ්‍යාවන් වැඩිවන අතර එය ඇමරිකානු හා නෙටෝ හමුදා සේම සිය දැත් ලෙයින් පොඟවාගෙන ඇත. මිලිටරි මදාවියේ අවසානයක් ද දක්නට නැත.

යුද්ධයට එරෙහිව නිර්ව්‍යාජ විරුද්ධත්වයක් පෑම සඳහා නම්, යුද්ධයෙන් සිදු වුනු විපත්වලට හිලව් වශයෙන් සහ විනාශයට පත් රට යලි ගොඩ නැගීමට මූල්‍ය සම්පාදනය වශයෙන් වන්දි ලබා දෙන බව සහතික කරන ගමන්, ඇෆ්සනිස්ථානයෙන් සියලු විදේශ හමුදා වහා ම ආපසු කැඳවීමට පෘථිවි ගෝලය පුරා වෙසෙන කම්කරුවන් ද තරුනයන් ද බලමුලු ගැන්විය යුතු ය.

ස්ටීවන් ස්ටයින්බර්ග්

© www.wsws.org